# 02 මවු සෙනේ

**'මවු සෙනේ'** නම් ගුවන්විදුලි නාට්‍යය පන්සිය පනස් ජාතක පොතේ දැක්වෙන **'මාතුපෝසක'** ජාතකය ඇසුරෙන් ප්‍රවීණ ගුවන්විදුලි ශිල්පියෙකු වන කරුණාරත්න අමරසිංහ මහතා විසින් රචනා කරන ලද්දකි. තම අන්ධ මාතාව පෝෂණය කරන්නා වූ ධවල හස්ති රාජයෙකුගේ චරිතය මෙහි නිරූපිත ය.

වේදිකා නාට්‍ය මෙන් දෘශ්‍ය ගෝචර කලාවක් නොවන ගුවන්විදුලි නාට්‍යය ශ්‍රව්‍ය ගෝචර වේ. එය රඟ දැක්වෙන්නේ ශ්‍රාවකයාගේ සිතෙහි ය. තමන් ශ්‍රවණය කරන ලද අවස්ථා පිළිබඳ ව පරිකල්පනය කිරීමට මෙහි දී ශ්‍රාවකයා පෙලඹේ.

ගුවන්විදුලි නාට්‍යයක් නිර්මාණය වන්නේ සංවාද, සංගීතය, ශබ්ද හා නිශ්ශබ්දතා ඔස්සේ බව අපි දනිමු. සංවාද භාවිතයේ දී හඬ නගා කියන සංවාද, රහස් උච්චාරණ, ආත්ම භාෂණ ආදිය ඇතුළත් වේ. ජවනිකා වෙන් කර ගැනීමට, පසුබිම පිළිබඳ හැඟීමක් ලබා ගැනීමට, සිතේ හැඟුම් නිරූපණයට බොහෝ විට සංගීතය යොදා ගැනේ. එමෙන් ම නිහඬ බව හෙවත් විරාමය ද ගුවන්විදුලි නාට්‍යයේ ප්‍රබල අංගයකි. මෙහි ඇතුළත් කෙරෙන ගුවන්විදුලි නාට්‍යය උදාර මාතෘ ගුණය පදනම් කොට ගෙන රචනා වී ඇති අතර, එය මිනිස් සමාජය තුළ යහගුණ වර්ධනය කිරීමේ අධ්‍යාශයෙන් ඉදිරිපත් කොට ඇත.



# මවු සෙනේ

තේමා වාදනය ....................
ගුවන්විදුලි රඟමඬල
**'මවු සෙනේ'** මාතුපෝසක ජාතකය ඇසුරෙන්
(අණ බෙරයක් ගසන හඬ)

**පුරුෂයා** : (තමාට) ම්... අණ බෙරයක් නේ ද? ගෙයින් එළියට බැහැලා බලන්න ඕන මොකක් ද අණ බෙරේ කියලා. කෝ බලන්න. මොනව රාජ පුරුෂයෙක් නේ ද? මහ රජ්ජුරුවන්ගෙ ආඥවක් වෙන්න ඕනෑ.

**අණබෙරකරු** : (උස් හඬින්) (ඇතින්) අප මහා රාජෝත්තමයන් වහන්සේට මංගල හස්ති රාජයා වීමට සුදුසු හස්ති රාජයෙකු දුටුවෝ දන්වත්වා! (දෙවරක් කියැවෙයි)

(ඉන් පසු අණ බෙර හඬ කෙමෙන් ඈත් වී ගොස් නැසී යයි)

**පුරුෂයා** : (තමාට) මේක නම් මගේ ම පූරුවෙ වාසනාවකට සිද්ධ වෙච්ච දෙයක්. එද මං කැලේ දි දැක්ක ඇතා නම් රජ්ජුරුවන්ගෙ මංගල හස්තිරාජයා හැටියට හරියට ම ගැළපෙනවා. ඌ කොච්චර තේජස් පෙනුමක් තියෙන සතෙක් ද? උසට උසේ හිම කන්දක් වගේ සුදු ම සුදු පාටයි. උසට ම හරියන මහත. දළ දෙකෙන් රැස් විහිදෙනවා. අහම්බෙන් හරි එද ඒ හස්තිරාජයා ඇහැ ගැහුණෙ මගෙ පූරුවෙ වාසනාවකට ම තමයි. දැන්ම ම ගිහිල්ලා මේ ආරංචිය මහ රජ්ජුරුවන්ට දන්වා සිටින්නට ඕනෑ.
(අතුරු සංගීතයක්)





නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**මහ රජතුමා :** පුරුෂය, ඔබ මේ කියන්නේ ඇත්තක් ද? මට මෙය විශ්වාස කරන්න අමාරුයි.

**පුරුෂයා :** අවසර රාජෝත්තමයාණන් වහන්ස! මම කියන්නේ සත්‍යයක්මයි.

**මහ රජතුමා :** එම්බා! පුරුෂය, තොප කියන විධියට මගේ හිටපු මඟුල් ඇතා ළඟවත් නො තිබුණු අමුතු ලකුණු මේ ඇතා ළඟ තියෙනවා. මගේ හිටපු මඟුල් ඇතා උසස් ම හස්ති ගෝත්‍රයට අයිති මහා බල සම්පන්න දුර්ලභ ගණයේ සත්ත්වයෙක්. ඌට තිබුණේ දුර්ලභ ගණයේ අලංකාර දළ දෙකක්. තොප කියන විධියට තොප වනයේ දී දුටු ඇතා මගේ හිටපු මඟුල් ඇතා වගේ දෙගුණයක් උස මහත ඇති සතෙක්. ඒ වගේ ම ඌට ඇත්තේ මිහිපිට කලාතුරකින් දකින්න ලැබෙන රැස් විහිදෙන අලංකාර දළ දෙකක්.

**පුරුෂයා :** එසේමයි මහ රජතුමනි, ඔබ වහන්සේට එය සියැසින් ම දැක ගන්න පුළුවන් ඒ ඇතා අල්ලාගෙන ආවට පස්සේ.

**මහ රජතුමා :** (හඬනගා) රාජ පුරුෂය වහා මේ පුරුෂයා ඇත්හලට කැඳවාගෙන ගොස් ඇතැදුරාට බාර දෙනු.

**රාජ පුරුෂයා:** යහපති, මහ රජතුමනි.

**මහ රජතුමා :** පුරුෂය, ඔබ ඇතැදුරා සමග කතා කොට ඔය කියන ඇතු වහා අල්ලාගෙන ඒමට සියලු කටයුතු සූදානම් කරනු. ඊට අවශ්‍ය සියලු දේ රාජ භාණ්ඩාගාරයෙන් සපයා දේවි. (හඬ නගා) භාණ්ඩාගාර ඇමති, මෙම පුරුෂයාට අවශ්‍ය සියලු දේ ම සපයා දීමට අප්‍රමාද ව කටයුතු කරනු.

**භාණ්ඩාගාර ඇමති :** යහපති, මහරජතුමනි.

**මහ රජතුමා :** හොඳයි පුරුෂය, දැන් තොපට රජ වාසලින් පිට ව යා හැකියි. අදින් සත් දිනක් ඇතුළත තොප කියන ඔය ඇතා අල්ලා මා වෙතට ගෙන ආ යුතු යි. එසේ ගෙන ආ කල තොපට ඇතෙක් බරට වස්තුව.

**පුරුෂයා :** යහපති, මහ රජතුමනි. මට යාමට අවසර.

(අතුරු සංගීතයක්)

• • •

(ඝන වනාන්තරයක හඬ)

**පුරුෂයා** : (තමාට) ආ අර ඉන්නෙ ඇතා. ම්... මොනවද ඌ අර විලට බැහැල කරන්නෙ. ආහාරයට නෙළුම් පඳුරු ගලවනවා. (රහස් හඬින්) ඇතැදුරාණෙනි, අර අර ඉන්නේ මම කියපු ඇතා තමයි.

**ඇතැ'දුරා** : (රහස් හඬින්) පුරුෂය, අපි එක පාරට කලබල වුණොත් ඌ අපටත් අනතුරු කරලා, පැනලා යන්න පුළුවන්. ඒක නිසා අපි බොහෝ ම පරීක්ෂාවෙන් ඉඳල ඌව අල්ල ගන්න උත්සාහ කරන්න ඕන.

**ඇතා** : (තමාට) ම්... මිනිස් ගඳක් දැනෙනවා. කවුරු හරි මිනිස් පිරිසක් මේ විල අසල ගැවසෙනවා වගෙයි. මිනිස් ගඳ හුළඟට එන්නෙ විලට උතුරු දිසාවෙන්. හෙමින් සීරුවේ සැක නොහිතෙන්න ඒ පැත්තට හැරිලා බලන්න ඕනෑ. ඒ... මොනව. අර රූස්ස ගස් අස්සට මුවා වෙලා ඉන්නෙ මිනිස්සු කණ්ඩායමක් නේ ද? ඒ අයගේ අතේ විසාල රැහැන්. මඳු ගහලා මාව අල්ල ගන්නයි මාන බලන්නෙ. ම්... අර කවුද ඉස්සරහට ඇවිත් මං ගැන විපරම් කරන්නෙ. ම්... කෝ බලන්න හැබෑට ම මේ ඔහු නේ ද? ඔව්. මේ ඒ පුරුෂයා තමයි. එහෙනං මාව අල්ලන්න ඔත්තුව දීල තියෙන්නෙ මේ ගුණමකු ද්‍රෝහී පුරුෂයයි. අනේ එද මා ඔහුට පිහිට වුණු බව මේ දුෂ්ට පුරුෂයා අමතක කළ හැටි.

(ඝන වනාන්තරයක හඬ මැකී යයි)
(අතුරු සංගීතයක්)

● ● ●

(අතීතය)
(ඝන වනාන්තරයක හඬ)

**පුරුෂයා** : (මහ හඬින් කෑ ගසයි) හෝ..... හෝ....... හෝ......

**ඇතා** : (තමාට) ආ. මිනිස් කට හඬක්. වනාන්තරේ මං මුළා ව ගිය කෙනෙක් වෙන්න ඕනෑ. විල දිහාවෙනුයි ඒ හඬ ඇහුණේ. ගිහින් බලන්න ඕනෑ. දඩයමේ ඇවිත් හරි, දැව දඬු කපන්න ඇවිත් හරි මඟ සොයා ගන්න බැරුව යන්න ඇති. ආ. මං හිතුව හරි. අර විල් ඉවුරෙ ඇත මෑත බලබල ඉන්නෙ ඒ පුරුෂයා. මොහු අනාථයෙක්. මම ඉන්දැද්දි මොහුට විපතක් කරදරයක් වෙන්න ඉඩ ඇරීම සුදුසු නැහැ. මම ඔහුට පිහිට වෙන්න ඕනෑ.

**පුරුෂයා** : (තමාට) ආ ඇතෙක් නේ ද? සද්දන්ත ඇතෙක්. මං ඉවරයි. මං ඉවරයි. කොහොම හරි මෙතනින් දුවල පණ බේර ගන්න ඕනෑ.

ඇතා : (හඬ නගා) පුරුෂය දුවන්න එපා. නවතින්න. මගෙන් ඔබට කිසි ම අනතුරක් වෙන්නෙ නැහැ. ඒ නිසා බය වෙන්න කාරණයක් නෑ. ඇයි ඔබ මෙහෙම කෑ ගැහුවේ.

පුරුෂයා : (තමාට) භයානක පෙනුමක් තිබුණත් කරුණාවන්ත සතෙක්. (හඬ නගා) ඇතාණෙනි, මා මං මුළා ව අදට සත් දවසක් වෙනවා. අල හාරා කකා, පලා කඩා කකා යන්තං පණ රැක ගත්තා. ආපහු මග හොයාගෙන මිනිස් පියසට යන්න පිහිටක් බලාපොරොත්තුවෙනුයි මං ඒ විදිහට කෑ ගැහුවේ.

ඇතා : පුරුෂය, බය නොවන්න. මම ඔබ මිනිස් පියසට ඇරලවන්නම්. එන්න. ඇවිදින් මගේ පිට උඩ හිඳ ගන්න. මම අද ම ඔබ මගේ පිටින් ගම්මානයට ගෙන යන්නම්.

(ඝන වනාන්තරයේ හඬ මැකී යයි)

● ● ●

(අතුරු සංගීතයක්)
(වර්තමානය)
(ඝන වනාන්තරයක හඬ යළි මතුවෙයි)

ඇතා : (තමාට) එහෙම එදා මම මේ කළගුණ නොදත් දුෂ්ට පුරුෂයාට පිහිට වෙලා කරල තියෙන්නේ මොන තරම් අඥාන ක්‍රියාවක් ද? දැන් ඒ ගැන පසුතැවිලි වෙලා පලක් නැහැ. අන්න ඔවුන් මාව මදු ගහල අල්ලන්න සූදනම් වෙනවා. මං මහා බල ඇති කෙනෙක්. ඇතුන් දහක් වුණත් ජය ගන්න මට ශක්තිය තියෙනවා. කෝපයට පත් වුණහම මුළු රටක් වුණත් විනාශ කරලා දන්න මට පුළුවන්. මේ දුබල මිනිස් රැළ එක හොඬ පහරකින් අකා මකා දන එක මට සුළු දෙයක්. ඒත් මා එවැනි දේ නො කළ යුතුයි. මේක මගේ පූරුවේ කර්ම විපාකයක් වෙන්න පුළුවන්. ඒ නිසා අත්පත්වන ඉරණම කුමක් වුණත් එය නො කිපී දරා සිටිය යුතුයි.
(ඝන වනාන්තරයක හඬ මැකී යයි)

● ● ●

(අතුරු සංගීතයක්)
(ඝන වනාන්තරයක හඬ)

ඇත් මව : (තමාට) මොකද අද තාම මගේ පුතා නාවේ. මට කන්න නෙළුම්දලි කඩා ගෙන එන්න විලට යනවයි කියලයි ගියෙ. ඇයි අද මෙච්චර ප්‍රමාද. පුතාට මොකක් හරි විපතක් කරදරයක්වත් ද? මට ඊයේ රෑ පෙනිච්ච හීනෙ එහෙම දේකට පෙර නිමිත්තක් ද? මං ඕකනෙ

පුතේ, පුතා අද උදේ පිටත් වෙලා යනකොට කිව්වෙ......

● ● ●

(අතීතය)

**ඇත් මව** : පුතේ මං ඊයේ බොහෝ ම නරක හීනයක් දැක්ක. මං හිතන්නේ අද කොහෙවත් නො ගිහින් ඉන්න එක හොඳයි. මගේ ඇස් දෙක අන්ධ වුණාට පුතා තමයි මගෙ ඇස් දෙක. ඒ ඇස් දෙකට යමක් වුණොත් මට ජීවත් වෙලා වැඩක් නෑ. මං කියන එක අහල අද කන්න හොයන්න නො ගිහින් ඉන්න පුතේ.

**ඇතා** : මට පුළුවන් ද අම්මෙ, අම්මව බඩගින්නෙ තියන්න. හීන පිට හීන දැක්කත් මට නං ඒක කරන්න බෑ. මට පුළුවන් බඩගින්නෙ ඉන්න. ඒත් මං කොහොමද අම්මව බඩගින්නෙ තියන්නෙ. අම්ම බය වෙන්න එපා. මට විශ්වාසයි අම්මෙ මට කරදරයක් විපතක් වෙන්නෙ නෑ කියලා.

**ඇත් මව** : පුතේ මං කියන දේ අහන්න. මං ඊයේ රෑ දැක්කෙ එසේ මෙසේ හීනයක් නෙමෙයි. බොහෝ ම නපුරු නරක අසුබ හීනයක්. මට හිතෙනව හීනෙ පෙනුණෙ මොකක් හරි විපතක් ගැන කල් තියා කියන්න වෙන්න ඇති කියලා. අද දවසෙ මං බඩගින්නෙ ඉන්නං. මේ අන්ධ නාකි මට දවසක් බඩගින්නෙ ඉන්න පුළුවන් නං මේ යෝධ බල යෝධ වීරිය ඇති පුතාට ඉන්න බැරිකමක් නැනේ. බඩගින්න වගේ ද මොකක් හරි අතුරු අන්තරාවක් සිද්ධ වුණොත්.

**ඇතා** : අම්මේ හැම සතෙකුට ම තියෙන ලොකු ම ලොකු අතුරු ආන්තරා ව තමයි බඩගින්න. බඩගින්න නිවා ගන්න බැරිවුණා ම සත්ත්වයෝ ඕනෑ ම අතුරු ආන්තරාවකට මූණ දෙන්න ලැස්තියි. අම්ම බය නැතුව ඉන්නකෝ. මං විලට ගිහිල්ල අලුත් නෙළුම්දලි ටිකක් කඩාගෙන එන්නම්. ආවට පස්සේ අම්මා මං අර දිය ඇල්ල ගාව ගල් පොකුණට එක්කන් ගිහින් නාවන්නංකෝ. අම්මේ මං ඉක්මනට ගිහින් එන්නං. මට මොකුත් කරදරයක් විපතක් සිද්ධ වෙන්නෙ නෑ අම්මේ. මට ඒක හොඳට ම විශ්වාස යි.

● ● ●

(වර්තමානය)

**ඇත් මව** : (තමාට) අනේ මගේ පුතා මේ වනාන්තරේ ඉන්න සියලු ම වන දෙයියො ආරස්සා කර දෙන්න ඕනෑ. අනේ මගේ පුතාට මොකක් හරි විපතක් ද? වෙන දා නං පුතා විලට ගිහින් එන්න මෙච්චර වෙලා ගත වෙන්නෙ නැනේ. පුතා අද කැලෑවෙ කෙළවර දිහාවටවත් ගියා ද? කැලෑව කෙළවර මනුස්ස වාසයට ළඟයි නෙ. මං කොහොම

ද මගේ පුතා ඉන්න තැනක් හොයාගෙන යන්නෙ. මගේ ඇස් දෙක ම අන්ධයි. ඇස් දෙක නො පෙනුණත් අත ගගා හරි කැලේ මැද්දෙන් පුතා හොයාගෙන යන්න තිබුණ. කොහොමද හිතට හයිය තිබුණත් එහෙම යා ගන්නෙ අත පය වලංගු නැතිකොට මං කොහොම ද දරු කැක්කුම උහුලං ඉන්නේ. මග වැටිල මළත් කමක් නෑ. මං කොහොම හරි යනව මගේ පුතා ඉන්න තැනක් හොයාගෙන. එයාගෙ ඇඟට අත තියල එයා අඳුනගන්න ලැබෙන කං, එයා අම්මේ කියල මට කතා කරන හඬ අහන්න ලැබෙන කං මං යනව මගෙ පුතා හොයාගෙන. මං පුතා ඉන්න තැනක් හොයාගෙන එනව මගෙ පුතේ. ඔව් මං එනව මගෙ පුතේ. ඔව් මං එනවා.

(ඝන වනාන්තරයක හඬ මැකී යයි)

● ● ●

(ශෝකී සංගීතයක්)

**මහ රජතුමා** : (තමාට) දැන් මේ ඇත් රජු අල්ලාගෙන ඇවිත් සත් දවසක් ම ගත වුණා. ඒ සත් දවස තිස්සේ ම මේ ඇත් රජු ආහාර ගැනීම ප්‍රතික්ෂේප කරනවා. මොන තරම් අග්‍ර භෝජන දුන්නත් ඇත් රජු ඒ දිහා බලන්නෙවත් නෑ. මේකට මොකක් හරි බලවත් හේතුවක් තියෙන්න ඕනෑ. මේ ඇත් රජුගෙන් ඒ ගැන විමසා බැලිය යුතුයි. (හඬ නගා) හස්ති රාජය, ඇයි ඔබ මෙහෙම ආහාර ගැනීම ප්‍රතික්ෂේප කරන්නේ. මොකක් ද ඔබේ දුක. මොකක් ද ඔබේ වේදනාව.

**ඇතා** : මහ රජතුමනි, මා දුක් වන්නේ මං ගැන නෙමෙයි. මං වාසය කළ වනාන්තරයේ හුදෙකලාව, කුසගින්නේ මං කෑම හොයා ගෙන එනතුරු බලා ඉන්න, මගේ මහලු අන්ධ මෑණියන් ගැනයි. ඇය අසරණයි. ඇය කොතරම් මහලු ද කියනවා නම් ඇයට වැදහෝනා තැනින් තනියෙන් නැගිටගන්නවත් බෑ මගේ උදව්වක් නැතුව. මං තමයි ඇය නැගිට්ටවන්නෙ. මං තමයි ඇය නාවන්නෙ. මං තමයි ඇයට කවන්නේ පොවන්නේ. මං විලට ගිහින් නෙළුම්දැලි උදුරා ගෙනල්ලා, වනේ ඇවිදලා පලා පල කඩා ගෙනල්ලා ඇයට කවනවා. ගල් පොකුණට වත්තන් කරගෙන ගිහින් නාවනවා. මං එහෙම කෑම හොයා ගෙන විලට ආ ගමන් තමයි ඔබතුමාගෙ ඇතැදුරයි, පිරිසයි අතට මං අහු වුණේ. අනේ මීට පස්සෙ මගේ අසරණ මහලු අන්ධ මෑණියන් කවුරු පෝෂණය කරන්න ද? ඇය බඩගින්නෙ ම ඉඳලා මං නැති ශෝකයෙන් මිය යාවි. ඒක සිහි වෙන කොට ඇති වන දුක මම කොහොම වාවන්න ද මහ රජතුමනි!

මහ රජතුමා : පින්වත් හස්ති රාජය, ඔබ තිරිසන් සත්ත්වයෙකු වුණත් ඔබ තුළ පිහිටි ඒ උතුම් ගුණයට මම ගරු කරනවා. ඔබ ගැන මම පැහැදුණා. මවුට සැලකීමේ ඔබේ ඒ උතුම් ගුණය මිනිසුන් වන අපිටත් ආදර්ශයක් (හඬ නගා) රාජපුරුෂය, වහා මේ ඇත් රජු බන්ධනයෙන් මුදලා, සුරක්ෂිත ව අරගෙන ගිහින් ඒ ඇත් රජු සිටි වනාන්තරයට ම යන්නට හරිනු.

අරුත් පැහැදිලි කිරීම්

| | | |
|---|---|---|
| ආඥාව | - | අණ, නියම කිරීම |
| අඥාන | - | අනුවණ, නුවණ නැති |
| ඇතැදුරා | - | ඇත් + ඇදුරා, ඇතුන් හික්මවන්නා |
| තාවුල්ල | - | වැවට දියවර ලැබෙන වැව අද්දර ඉහළ පෝෂක කලාපය |
| නෙළුම්බු දලි | - | නෙළුම් දලු |
| පරිකල්පනය | - | සිතින් මවා ගැනීම |
| ශ්‍රවණේන්ද්‍රිය | - | සවන (කන), ශ්‍රවණ + ඉන්ද්‍රිය |
| ශ්‍රාවකයා | - | අසන්නා |
| සියපත | - | නෙළුම/නෙළුම් මල/පත්‍ර සිය ගණනක් ඇති |

## ක්‍රියාකාරකම 01

**පාඩමෙහි ඇතුළත් ගුවන්විදුලි නාට්‍යය ශ්‍රවණයකොට හෝ කියවා පහත සඳහන් ක්‍රියාකාරකම්වල යෙදෙන්න.**

(i) 'මවු සෙනේ' නම් නාට්‍යයේ එන චරිත හඳුන්වා, ඒවායින් එක් චරිතයක් නිරූපණය වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ii) 'මවු සෙනේ' නම් ගුවන්විදුලි නාට්‍යයට පාදක වූ ජාතක කථාව කෙටියෙන් දක්වන්න.

(iii) 'මවු සෙනේ' නාට්‍යයෙන් හඳුනාගත හැකි ගුවන්විදුලි නාට්‍ය ලක්ෂණ මොනවා ද?

## ක්‍රියාකාරකම 02

**පන්තිය කණ්ඩායම් වශයෙන් බෙදී පහත සඳහන් ක්‍රියාකාරකම්වල යෙදෙන්න.**

(i) මෙම නාට්‍යයේ තේමාව වී ඇත්තේ යහපත් සමාජයක් ගොඩනැගීමට ආධාර වන උතුම් සාරධර්මයකි. මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

(ii) ඇතාගේ මාතෘ උපස්ථානය ඇතුළු වෙනත් ගුණධර්ම පිළිබඳ සාකච්ඡා කරන්න.

(iii) මෙම නාට්‍යයේ සඳහන් මාතෘත්වයේ උදර බව පෙන්වන අවස්ථාවක් දක්වා ඒ පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න.

(iv) මෙහි දැක්වෙන නාට්‍යමය අවස්ථා පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම 03

(1) ගුවන්විදුලි නාට්‍ය පිළිබඳ ව පුවත්පත් අතිරේකයක් සකස් කරන්න. ඒ සඳහා පහත සඳහන් අංග ඇතුළත් කරන්න.

i වැඩිහිටියන් විසින් ශ්‍රවණය කරන ලද ගුවන්විදුලි මාලා නාටක පිළිබඳ ඔවුන්ගේ අදහස් ඇතුළත් කරමින් සකස් කරන ලද ලිපියක්. (මුවන්පැලැස්ස ආදි)
ii **'මවු සෙනේ'** ගුවන්විදුලි නාට්‍යය ඇසුරෙන් චිත්‍රයක්
iii ළමා ගුවන්විදුලි නාට්‍යයකට සවන් දී ඒ පිළිබඳ අදහස් දැක්වීමක්
iv සිය පුතුගේ පමාව පිළිබඳ සන්තාපයට පත් වන මවගේ සිතුවිලි ආශ්‍රයෙන් ගද්‍ය/පද්‍ය නිර්මාණයක්